# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය** | **නර්තනය - II**

නම/ විභාග අංකයඃ ……………………………………… කාලය පැය 2යි

**පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01)

i. සොකරි නාටකයේ වාදනය සඳහා වන්නි ප්‍රදේශයේ දී ……………………… භාවිත වේ.

ii. "ශාන්ත" නැමැති ස්ථායිභාවය හේතුකොට ගෙන …………………… රසය නිරූපණය වේ.

iii. මෝල් ගස් නැටුම සඳහා ශාන්තිකර්මවල එන …………………………….. කවි යොද ගැනේ.

iv. ප්‍රශස්ති කාව්‍ය අතර මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍ය ලෙස ගැනෙන්නේ …………………………… ය.

v. උඩරට වන්නම් ගායනා කරන ලද්දේ …………………… මඩුවේදී ය.

vi. බීජාක්ෂර පදනම් කරගෙන උපදින අනෙකුත් අක්ෂර ………………………….. වේ.

vii. එඩැක්ක නම් වාද්‍ය භාණ්ඩය …………………… නර්තනය සඳහා යොදා ගනී.

viii. කෝළම් නාටක රඟමඩල …………………….. නමින් හඳුන්වයි.

ix. කෝළම් නාටකයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා සුසිර වාද්‍ය භාණ්ඩය ලෙස සැලකෙන්නේ
1. ……………………………. 2. ………………………….…

x. පහත සඳහන් නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම දෙක නම් කරන්න.
1. ගබඩා කොල්ලය 2. පොත්කඩේ පෙළපාලිය

(ලකුණු 12)

02)

i. මාත්‍රා 2+4 දෙතිතේ තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල 3)

ii. පහත දැක්වෙන කවි පද මාත්‍රා හතරේ තනි තිතට ප්‍රස්තාර කරන්න. (ල 4)
1. සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට
2. බසිමින් චාමර ගත්තේ සුරතට

iii. මුසලඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න. (ල 5)

03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ආහාර්ය අභිනය

ii. අණබෙර

iii. වන්නම්

iv. තුන්තිතේ ප්‍රභේද

v. ග්‍රහපන්ති කවි

(ලකුණු 3x4=12)

04)

i. දේශීය ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු තුනක් ලියන්න. (ල 3)

ii. දෙවොල් මඩුවේ හෝ පහන් මඩුවේ සැරසිලි පිළිබඳ විස්තර කරන්න. (ල 4)

iii. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ කථා පුවත තුළින් සමාජයට ලබාදෙන ආකල්ප සැකෙවින් විස්තර කරන්න. (ල 5)

05)

i. උඩරට හා පහතරට ගැමි නාටක දෙකක් නම්කර එහි වෙනස්කම් පිළිබඳව විමසන්න. (ල 3)

ii. පහතරට සාම්ප්‍රදයට අයත් ගැමි නාටකය අතීත හා වර්තමාන අරමුණු විස්තර කරන්න. (ල 4)

iii. ජස ලෙංචිනා කෝලම ඇසුරෙන් ජන ජීවිතයට විවරණය වන ආකාරය විමසුමට ලක්කරන්න. (ල 5)

06)



A



B

i. ඉහත A හා B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදයන් දෙක නම් කරන්න. (ල 2)

ii. ඉන් එක් සම්ප්‍රදයක සංගීත සම්ප්‍රදය නම්කර ප්‍රධාන අවනද්ධ භාණ්ඩය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල 4)

iii. B රූපයට අයත් නර්තන සම්ප්‍රදයේ වේශ නිරූපණය පිළිබඳ විස්තර කරන්න. (ල 6)

07)

i. 1970 න් පසු නර්තන අධ්‍යාපනයේ ඇතිවූ සංවර්ධනය පිළිබඳ විස්තර කරන්න. (ල 4)

ii. 21 වන සියවසේ නව තාක්ෂණික ප්‍රවනතා නර්තනයට බලපා ඇති අයුරු විමසන්න. (ල 4)

iii. කරදිය හෝ කුඹී කතාව මුද්‍රා නාටකයෙහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න. (ල 4)